විදුලි පණිවුඩ : "විශ්‍රාම වැටුප්" කොළඹ
தந்தி : "ஓய்வூதியம்" கொழும்பு
Telegrams : "PENSIONS" Colombo

දුරකථන
தொலைபேசி
Telephones
2320316
2421786
2431305

ෆැක්ස්
பெக்ஸ்
Fax
2342078

# විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
# ஓய்வூதியத் திணைக்களம்
# DEPARTMENT OF PENSIONS

මගේ අංකය
எனது இல.
My No.
PN/4042/E

ඔබේ අංකය
உமது இல.
Your No.

මාළිගාවත්ත මහලේකම් කාර්යාලය,
මාළිගාවත්ත,
කොළඹ 10.
மாளிகாவத்தை செயலகம்,
மாளிகாவத்தை,
கொழும்பு 10.
Maligawatte Secretariat,
Maligawatte,
Colombo 10.

දිනය
திகதி
Date
2005.~~10~~ 11 .25

**විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව චක්‍රලේඛ 5/2005 (1)**

සියලුම විදේශීය දූත මණ්ඩල නිලධාරීන්
ප්‍රාදේශීය ලේකම්වරුන්
බැංකු කළමනාකරුවන්

**විදේශගත ශ්‍රී ලාංකික විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප ගෙවීම**

විදේශයේ පදිංචි ශ්‍රී ලාංකික විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප් ශ්‍රී ලංකාවේදී ගෙවීම යන මැයෙන් 2005.07.27 වන දින මවිසින් නිකුත් කරන ලද විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 5/2005 මින් අවලංගු කරන අතර ඒට ප්‍රතිශෝධනයක් වශයෙන් මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

ශ්‍රී ලාංකික විශ්‍රාමිකයින් 20,000 ක් පමණ ප්‍රමාණයක් විදේශ රටවල වාසය කරන අතර ඇතැම් විශ්‍රාමිකයින් මියගිය පසුවද වෙනත් පුද්ගලයින් වංචා සහගත ලෙස විශ්‍රාම වැටුප් ලබාගත් අවස්ථා ගණනාවක් හෙළිවීම නිසා එම වංචා අවම කිරීමේ පරමාර්ථයෙන් සහ විදේශීය විශ්‍රාමිකයින්ට මග පෙන්වීමක් වශයෙන් මෙම චක්‍රලේඛය නිකුත් කරන බව කරුණිකව දන්වමි. මේ අනුව වෙනත් රටක පදිංචි ශ්‍රී ලාංකික විශ්‍රාමිකයකුට තම විශ්‍රාම වැටුප පහත සඳහන් පරිදි ලබාගැනීමේ පහසුකම් මින් සලසා දෙනු ලැබේ.

1. **විශ්‍රාම වැටුප විදේශ විශ්‍රාම වැටුපක් සේ (Foregn Pensions) ලබාගත හැකිවීම**

එක්සත් රාජධානිය, ඕස්ට්‍රේලියාව, කැනඩාව හා ඉන්දියාවේ පදිංචි ශ්‍රී ලාංකික විශ්‍රාමිකයන්ට තම විශ්‍රාම වැටුප මහ කොමසාරිස් කාර්යාල මගින් ලබාගත හැකිය. මීට අමතරව වෙනත් රටවල්වල පදිංචි විශ්‍රාමිකයන්ට විදේශීය රාජ්‍ය නියෝජිතයන් (Crown Agent) මගින් විශ්‍රාම වැටුප් ගෙවීමේ පහසුකම් සලසා ගත හැකිය.

තම විශ්‍රාම වැටුප විදේශ විශ්‍රාම වැටුප සේ ලබා ගැනීමට පහත සඳහන් ලියවිලි මෙම දෙපාර්තමේන්තුවට යොමු කළ යුතුය.

- A නිවැරදිව සම්පූර්ණ කරන ලද (Roll Form) පත්‍රිකා 2 ක්
- B මෑතකදී ලබාගත් ඡායාරූප දෙකක් (පාස්පෝට් ප්‍රමාණයේ මෙම ඡායාරූප Roll Form සහතික කළ නිලධාරියා විසින්ම සහතික කොට තිබිය යුතුය)
- C පදිංචිය සනාථ කෙරෙන ලියවිලි (පුරවැසි සහතිකය/නේවාසික බලපත්‍රය/පදිංචිය සනාථ කෙරෙන විදේශ දූත මණ්ඩල කාර්යාලය විසින් නිකුත් කළ ලියවිල්ල)
- D විදේශීය ගමන් බලපත්‍රයේ සහතික කරන ලද පිටපත්

මෙම ලියවිලි ලැබුණු වහාම ඉහත සඳහන් පරිදි මහ කොමසාරිස් කාර්යාලය හෝ Crown Agent මගින් විශ්‍රාම වැටුප ගෙවීමට පියවර ගනු ලැබේ.

2 **විදේශයක පදිංචි විශ්‍රාමිකයකු ලංකාවට පැමිණි විට තම ලිපිගොනුව පවතින ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙතින් (ලබානොගත්) හිඟ විශ්‍රාම වැටුප් එකවර ලබාගැනීම.**

මේ සඳහා පහත ලියවිලි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කළ යුතුය.

A අදාල කාලයට හිමි හිඟ විශ්‍රාම වැටුප් ලබානොගත් බවට ලිඛිත ඉල්ලීම

B ගමන් බලපත්‍රයෙහි ඡායා පිටපත

ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් හිඟ විශ්‍රාම වැටුප ගෙවීමට කටයුතු කෙරේ.

3 **ජීවිත සහතිකය (Life Certificate) ඉදිරිපත් කිරීම මගින් විශ්‍රාම වැටුප ලබාගැනීම**

තම විශ්‍රාම වැටුප ලබාගන්නා ශ්‍රී ලංකාවේ පිහිටි බැංකු ශාඛාව වෙත ජීවිත සහතිකය Pension Receipt Form (Pensions 01) හෝ වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප නම්, **භා සහ ගප 129 (Tr & Audit 129)** යන ආකෘති පත්‍රය මාසිකව ඉදිරිපත් කල යුතුය. මෙම ජීවිත සහතිකය බැංකුව වෙත ඉදිරිපත් කිරීමේදී පහත දැක්වෙන උපදෙස්වලට අනුකූල විය යුතුය.

(A) ජීවිත සහතිකය තමා පදිංචි රටෙහි සිට සෘජුවම විශ්‍රාම වැටුප් ලබාගන්නා බැංකුව වෙත තැපැල් මගින් එවිය යුතුය.

(B) ජීවිත සහතිකය විශ්‍රාමිකයා පදිංචි රටතුලදී නිසි පරිදි සහතික කොට තිබිය යුතුය. (අත්සන් සහතික කල නිලධාරියෙකුගේ නිල මුද්‍රාව හෝ පැහැදිලි ලිපිනය සඳහන් කල යුතු අතර මෙම සහතික අත්සන් කල හැකි නිලධාරීන් පිළිබඳව විශ්‍රාම වැටුප් Pension Receipt Form (Pensions 01) හා **භා සහ ගප 129 (Tr & Audit 129)** ආකෘතියේ සඳහන් වේ.)

සෑම වසරකම ජනවාරි මාසයට අදාල ජීවිත සහතිකයේ අතිරේක පිටපතක් තැපැල් මගින් මෙම දෙපාර්තමේන්තුව වෙත (සහකාර අධ්‍යක්ෂ (විදේශ විශ්‍රාම වැටුප්) විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මහ ලේකම් කාර්යාලය, කොළඹ 10) එවිය යුතුය. මෙය 2006 ජනවාරි මස සිට ක්‍රියාත්මක වේ.

04 **විශ්‍රාමිකයාගේ ඥතියකු හෝ නියෝජිතයකු විසින් කරනු ලබන දිවුරුම් ප්‍රකාශනයක් සමඟ ජීවිත සහතිකය බැංකුව වෙත ඉදිරිපත් කිරීම**

විදේශයක පදිංචි විශ්‍රාමිකයෙකුට නිසි පරිදි සම්පූර්ණ කොට සහතික කරන ලද ජීවිත සහතිකය තම ඥතියෙකු හෝ නියෝජිතයකු වෙත එවිය හැකි අතර ඔහු විසින් ඇමුණුම් වශයෙන් දක්වා ඇති දිවුරුම් ප්‍රකාශනය සමඟ ජීවිත සහතිකය බැංකුව වෙත ඉදිරිපත් කළ යුතුය.

සෑම වසරකම ජනවාරි මාසයට අදල ජීවිත සහතිකයේ පිටපතක් හා දිවුරුම් සහතිකයේ පිටපතක් විශ්‍රාමිකයාගේ ඥතියා හෝ නියෝජිතයා විසින් මෙම දෙපාර්තමේන්තුවට ඉහත 03 හි ලිපිනයට එවිය යුතුය.

මෙම චක්‍රලේඛ උපදෙස් 2006 ජනවාරි මස සිට බලපැවැත්වෙන බව කාරුණිකව දන්වමි.

කේ. ඒ. තිලකරත්න
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ

පිටපත් 1. ලේකම්, රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය – දැ.ගැ.ස.
2. ලේකම්, විදේශ කටයුතු අමාත්‍යාංශය – අ.ක.ස.
3. ලේකම්, මුදල් අමාත්‍යාංශය – දැ.ගැ.ස.
4. දිසාපති/දිස්ත්‍රික් ලේකම්වරුන් - දැ.ගැ.ස.
5. විගණකාධිපති - දැ.ගැ.ස.

බැංකු කළමනාකරු

.........................................

......................................... ශාඛාව

**විශ්‍රාමිකයාගේ ඥාතියෙකු හෝ නියෝජිතයෙකු විසින් කරනු ලබන දිවුරුම් ප්‍රකාශනයයි.**

......................................... හි පදිංචි ......................................... වන
(දිවුරුම් ප්‍රකාශකගේ ලිපිනය) (දිවුරුම් ප්‍රකාශකගේ නම)

මම බෞද්ධ / ක්‍රිස්තියානි / මුස්ලිම් / හින්දු / ආගමිකයෙකු ලෙස අවංකවත්, සත්‍ය ලෙයත්, ගාම්භීරතාපූර්වකව ප්‍රතිඥා දී / දිවුරා ප්‍රකාශ කර සිටින වගනම්,

1. ඉහත නම් සඳහන් දිවුරුම් ප්‍රකාශක මම වෙමි.
2. විශ්‍රාම වැටුප් අංක / වැන්දඹු අනන්දරු විශ්‍රාම වැටුප් අංක: ......................................... යටතේ
(අංකය සඳහන් කරන්න)

......................................... ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන්

(ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නම)

විශ්‍රාම වැටුප් ලබාගන්නා ......................................... මහතා/මහත්මිය
(විශ්‍රාමිකයාගේ නම)

මේ වන විට .........................................

.........................................

......................................... පදිංචිව සිටී.

(විදේශීය ලිපිනය)

3. මෙම දිවුරුම් ප්‍රකාශය සිදුකරන අවස්ථාවේදී ඉහත විශ්‍රාමිකයා ජීවත්ව සිටින බව සහතික කෙරෙන ජීවිත සහතිකය මීට අමුණා ඇත.
4. ඉහත විශ්‍රාමිකයාගේ ඥාතියෙකු/නියෝජිතයෙකු වන මම.........................................

......................................... ස්ථිර
(ස්ථිර පදිංචි ලිපිනය)

පදිංචිය වන අතර ......................................... දරණ ජාතික හැඳුනුම්පත් අංකය හිමි වේ.
(ජාතික හැඳුනුම්පත් අංකය)

එමෙන්ම මා විසින් ......................................... බැංකුවෙහි ගිණුම් අංක
(බැංකුව හා බැංකු ශාඛාව)

......................................... යටතේ ජංගම / ස්ථිර ගිණුමක්ද මේවන විට පවත්වාගෙන යමි.

(ගිණුම් අංකය)

5. එමෙන්ම වැන්දඹුව / වැන්දඹු පුරුෂයා වෙනත් විවාහයක් සිදුකර නොමැති බව ද ප්‍රකාශ කරමි.

6. විශ්‍රාමික ------------------------------------------------------------ මහතාගේ / මහත්මියගේ

(විශ්‍රාමිකයාගේ නම)

ඥාතියෙකු / නියෝජිතයෙකු වශයෙන් මා පෙනී සිටින බවත්, මා විසින් මේ සමඟ ඉදිරිපත් කරන ජීවිත සහතිය සත්‍ය හා නිවැරදි ජීවිත සහතිකයක් බවට මා පිළිගන්නා බවත් මා විසින් ප්‍රතිඥා දෙන / දිවුරා ප්‍රකාශ කරන අතර මෙකී ජීවිත සහතිකය ව්‍යාජ ජීවිත සහතිකයක් වූවහොත් විශ්‍රාමිකයාගේ බැංකු ගිණුමට බැර කෙරෙන මුදල් ආපසු ගෙවීමට මා එකඟ වන බවත්, එමෙන්ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සක්‍රීය නීතිය මගින් ලබා දෙන්නා වූ දඬුවමකට මා යටත් වන බවත් මා හොඳකාරවම දනිමි.

ඉහත සඳහන් කරුණු මා විසින් කියවා තේරුම් කර දීමෙන් පසු ඉහත සඳහන් දිවුරුම් ප්‍රකාශක විසින් කියවා තේරුම් ගෙන වර්ෂ --------- ක් වූ --------- මස --------- දින --------- දී අත්සන් කරන ලදී.

--------------------------------------------

දිවුරුම් ප්‍රකාශක

මා ඉදිරිපිටදිය.

--------------------------------------------

සාමාදාන විනිශ්චයකාර

විදුලි පණිවුඩ : "විශ්‍රාම වැටුප්" කොළඹ
தந்தி : "ஓய்வூதியம்" கொழும்பு
Telegrams : "PENSIONS" Colombo

දුරකථන / தொலைபேசி / Telephones: 2320316, 2421786, 2431305

ෆැක්ස් / பெக்ஸ் / Fax: 2342078

මගේ අංකය / எனது இல. / My No. PN/C/O/P/1

ඔබේ අංකය / உமது இல. / Your No.

# විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
# ஓய்வூதியத் திணைக்களம்
# DEPARTMENT OF PENSIONS

මාලිගාවත්ත මහලේකම් කාර්යාලය,
මාලිගාවත්ත,
කොළඹ 10.

மாளிகாவத்தை செயலகம்,
மாளிகாவத்தை,
கொழும்பு 10.

Maligawatte Secretariat,
Maligawatte,
Colombo 10.

දිනය / திகதி / Date: 2005.~~10~~ 11. 25

කළමනාකාර අධ්‍යක්ෂ,
සාමාන්‍යාධිකාරී,
ප්‍රධාන විධායක,
-------------------------------- බැංකුව
--------------------------------
--------------------------------

<u>**විදේශ විශ්‍රාම වැටුප් ගෙවීම**</u>

මවිසින් නිකුත් කරන ලද විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 5/2005 (1) පිටපතක් මේ සමඟ ඔබ වෙත අමුණා එවමි. විදේශයන්හි පදිංචි ශ්‍රී ලාංකික විශ්‍රාමිකයින් ශ්‍රී ලංකාවෙහි වාණිජ බැංකුවක පවත්වාගෙන යන බැංකු ගිණුමක් තුළින් විශ්‍රාම වැටුප් ලබාගැනීමේදී ජීවිත සහතිකය ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ. විශ්‍රාමිකයා ජීවත්වන බව සනාථ කෙරෙන සහතිකය, මෙම ජීවිත සහතිකය බැවින් එය විධිමත්ව ලබාගැනීම ඉතා වැදගත්ය. එබැවින් ජීවිත සහතික ඉදිරිපත් කිරීමේදී බැංකු කළමනාකරුවන් පහත සඳහන් පරිදි කටයුතු කිරීම ඉතා වැදගත්ය.

01. ජීවිත සහතිකය විදේශයක සිට බැංකු ශාඛාව වෙත සෘජුව ලබාගැනීම

මෙහිදී එම ජීවිත සහතිකය නිසි පරිදි සම්පූර්ණ කර තිබීමත්, විදේශියකදී සහතික කොට තිබීමත් එමෙන්ම විදේශයක සිට තැපැල් මගින් බැංකුව වෙත ලැබීම ඉතා වැදගත් වේ.

02 විශ්‍රාමිකයාගේ නියෝජිතයකු හෝ ඥතියෙකු විසින් ජීවිත සහතිකය බැංකුව වෙත ඉදිරිපත් කිරීම

විවිධ ප්‍රායෝගික ගැටළු නිසා විදේශගත ඇතැම් විශ්‍රාමිකයින් විදේශයකදී සහතික කරන ලද තම ජීවිත සහතිකය තම ඥතියෙකු හෝ නියෝජිතයකු වෙත යොමු කොට ඔහු මගින් බැංකුව වෙත ඉදිරිපත් කරනු ලැබේ. මෙවැනි අවස්ථාවලදී විශ්‍රාමිකයාගේ ඥතියා හෝ නියෝජිතයා විසින් අමුණා ඇති දිවුරුම් සහතිකයක් ඉදිරිපත් කළ යුතු වේ. විශ්‍රාම වැටුප ගිණුමට බැර කල පසු එම දිවුරුම් සහතිකය හා ජීවිත සහතිකය ප්‍රාදේශීය ලේකම් වෙත යැවීමට කටයුතු කල යුතු බව කාරුණිකව දන්වා සිටිමි.

මෙම චක්‍රලේඛ අංක 5/2005(1) පිළිබඳව බැංකු ශාඛා කළමනාකරුවන් දැනුවත් කරන්නේ නම් මැනවි.

කේ. ඒ. තිලකරත්න
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ